# වැදගත් ලතින් නීති සිද්ධාන්ත සහ වචන කිහිපයක්
### (පෞද්ගල කලාප හා සම්බන්ධයි)

## ලතින් නීති සිද්ධාන්ත

*Obedientia est legis essentia* - අවනත වීම නීතියේ සාරයයි.

*Omnia Praesumuntur pro negante* - සියලුම පූර්වානුමිති අපලාපනය කරගන්නාගේ වාසියටයි.

*Omne testamentum morte consummatum est* - සෑම අන්තිම කැමති පත්‍රයක්ම මරණයෙන් සම්පූර්ණ වේ.

*Omnia praesumuntur solemniter esse acta* - සියලු දෙයම නිසි පරිදි කර තිබේය යන්න පූර්ව නිගමනය කළ හැක.

*Omnia nova constitutio futuris temporibus formam imponerie debet, non praeteritie* - සෑම නව නීතියක්ම අනාගතයට විනා අතීතයට බල නොපෑ යුතුය.

*Qui prior est tempore potior est jure* - කාලය අනුව මුල් පුද්ගලයා නීතිය ඉදිරියේද ප්‍රමුඛ වෙයි.

*Quod constat curiae opere testium non indiget* - උසාවියට ප්‍රත්‍යක්ෂ කැරුණක් ගැන සාක්ෂි අනවශ්‍යය.

*Res inter alioa acta alteri nocere non debet* - ආගන්තුකයින් අතර වූ ගනුදෙනුවකින් පාර්ශ්වකරුවකුට හානියක් සිදු නොවිය යුතුය.

*Spoliatus ante omnia restituendus est* - පැහැරගත් බුක්තිය සියල්ලටම පෙර ආපසු ලබාදිය යුතුය.

*Testes ponderantur, non numerantur* - සාක්ෂිකරුවන්ගේ සංඛ්‍යාවට වඩා ඔවුන්ගේ සාක්ෂි වල හරය වැදගත්වේ.

*Testie de visu praeponderat aliis* - ඇසුදුටු සාක්ෂිකරුවකු අන් පුද්ගලයන්ට වඩා වැදගත් වේ.

*Testie nemo in sua cause casse potest* - කිසිවකු තම නඩුවේම සාක්ෂිකරුවකු නොවිය යුතුය.

*Volenti non fit injuria* - ස්වෙච්ඡා සහගත බව නිසා හානිය අහෝසිවේ.

## ලතින් වචන

*Persona* - පුද්ගලභාවය
*Possessio* - භුක්තිය
*Possessio Civilis* - සිවිල් භුක්තිය
*Possessio Juris* - නීතික භුක්තිය
*Pro Semisse* - භාගයට
*Pro tanto* - ඒ ප්‍රමාණයට
*Pro tempore* - මෙම කාලයට පමණක්
*Pendente lite* - නඩු කාල සීමාව තුළ දෙනු ලබන දීමනා
*Quasi* - අර්ධ
*Ratio decidendi* - තීරණ හරය
*Rei vindicatio action*- හිමිකම ඔප්පු කිරීමේ නඩුකරය
*Res gestae* - ඒකසිද්ධිකරය
*Res integra* - කලින් නොවිසඳුනු දේ
*Res publicae* - ජන දේ
*Res litigosa* - නඩුවකට යටත් දේ
*Restitutio in integrum*- යථාතත්ත්වයට පැමිණීම
*Stare decisis* - පූර්වගමනය අනුව ක්‍රියා කිරීම
*Status quo* - යථා තත්ත්වය
*Supra* - ඉහත
*Testamentum* - තෙස්තමේන්තුව
*Traditio* - හිමිකම් භාරදීම
*Ultra virus* - බලාතික්‍රමණ
*Usucapio* - දීර්ඝ බුක්ති කාලාවරෝධය
*Venia aetatis* - වයෝ පූර්ණත්වයට පත්කිරීම
*Versus* - එදිරිව
*Vice Versa* - ප්‍රතිලෝම වශයෙන්
*Vide* - බලනු
*Vinculo matrimoni* - විවාහ බැඳීමෙන් වෙන්වීම.